{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved }

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

# අ.පො.ස. සාමාන්‍ය පෙළ පෙරහුරු ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2026

## 11 - S බුද්ධ ධර්මය i - ii කාලය පැ. 3 වි. 10

සැලකිය යුතුයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

1. බෞද්ධයකු වීමේ පළමු පියවර ලෙස බුදුදහම පෙන්වා දෙන්නේ,
   i. පන්සිල් ආරක්ෂා කිරීමයි. ii. ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීමයි.
   iii. තෙරුවන් සරණ යාමයි. iv. බුදුරදුන් වන්දනා කිරීමයි.
2. බුදුරජාණන් වහන්සේ විසින් ස්වකීය ශ්‍රාවකයන් හඳුන්වන ලද්දේ,
   i. භික්ඛු නාමයෙනි. ii. ආර්ය ශ්‍රාවක නාමයෙනි.
   iii. සංඝරත්නය නාමයෙනි. iv. ශ්‍රාවක සංඝ නාමයෙනි.
3. නිවන් පසක් කිරීමට අවශ්‍ය වන මනා වූ පිළිවෙත් රකින බැවින් මහ සඟරුවන,
   i. සුපටිපන්න නම් වේ. ii. උජුපටිපන්න නම් වේ.
   iii. ඤායපටිපන්න නම් වේ. iv. සාමීචිපටිපන්න නම් වේ.
4. නිවසේ පැවැති බාධක හමුවේ 'තිමිර'ට විභාගය සමත්වීමට නොහැකි වීම නිසා ඔහු මහත් සන්තාපයට පත්විය. බුදු දහමට අනුව එයින් වැළකීමට ඔහුට උපයෝගී කරගත හැක්කේ,
   i. තාදී ගුණය පිළිබඳ අවබෝධයයි. ii. දුක්ඛ සත්‍යය පිළිබඳ අවබෝධය යි.
   iii. ත්‍රිලක්ෂණය පිළිබඳ අවබෝධයයි. iv. විභාගය පිළිබඳ අවබෝධය යි.
5. සිදුහත් කුමරුට සැපවත් කාමභෝගී ජීවිතයක් සඳහා පිය රජු විසින් ඍතු තුනකට වෙන්කළ අනුරූප මාලිගා තුන වන්නේ,
   i. රම්‍ය, සුරම්‍ය, සුභ - ගිම්හාන, හේමන්ත, වස්සාන
   ii. රම්‍ය, සුභ, සුරම්‍ය - ගිම්හාන, වස්සාන, හේමන්ත
   iii. රම්‍ය, සුරම්‍ය, සුභ - හේමන්ත, වස්සාන, ගිම්හාන
   iv. සුරම්‍ය, රම්‍ය, සුභ - වස්සාන, හේමන්ත, ගිම්හාන

Past Papers Wiki

6. බුදුහිමි තනතුරු පිරිනැමීමේ දී තනතුරු ලාභියා සතු නිසග කුසලතාව මත තනතුරු පිරිනැමූ සේක. එහෙත් ලබා දුන් තනතුරට අසතුටු වූයේ,

i. රාධ තෙරුන් ය.　　ii. කොණ්ඩඤ්ඤ තෙරුන් ය.

iii. චන්න තෙරුන් ය.　　iv. ආනන්ද තෙරුන් ය.

7. සිද්ධාර්ථ බෝධිසත්වයෝ වසර .......... දුෂ්කරක්‍රියා කළහ.

i. හයක්　　ii. අටක්

iii.දහයක්　　iv. දොළහක්

8. තිලකුණු අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

i. දුක්ඛ, අනිත්‍යය, අනාත්ම.　　ii. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම.

iii. අනාත්ම, දුක්ඛ, අනිත්‍ය.　　iv. අනිත්‍ය, අනාත්ම, දුක්ඛ.

9. සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ හෙයින් ද රහසින්වත් පව් නොකළ හෙයින් ද සියලු පූජාවන් ලැබීමට සුදුසු වූ හෙයින් ද බුදුරජාණන් වහන්සේ,

i. සම්මා සම්බුද්ධ වන සේක.　　ii. භගවා නම් වන සේක.

iii. අරහං නම් වන සේක.　　iv. සත්ථා දේවමනුස්සානං නම් වන සේක.

10. පාරමිතා පුහුණු කිරීමේදී සම්පූර්ණ කළ යුතු කරුණු පහකි. ඒ අතරින් ජීවිතයට එක්කොට ගතයුතු වන්නේ,

i. විචිකිච්ඡාවයි.　　ii. තණ්හාවයි.

iii. මිථ්‍යාදෘෂ්ටියයි.　　iv. උපාය කෞෂල්‍යය ඥානයයි.

11. භික්ෂූන් වහන්සේ සමාජයට බරක් නොවන ආකාරයෙන් සැදැහැවතුන්ගේ ප්‍රත්‍ය පහසුකම් ලබා ගත යුතු බව බුදුරජාණන් වහන්සේ වදාළ සේක. ඒ සඳහා වඩාත් උචිත උදාහරණය වන්නේ,

i. ගමේ වසන මුනිවරයෙකු සේ.　　ii. බඹරා මල නොතලා රොන් ගන්නා සේ.

iii. රජය අය බදු ගන්නාක් මෙන්.　　iv. වේයා තුඹස බඳින්නාක් මෙන්.

12. බුද්ධ, ධම්ම යන රත්න දෙක වෙසක් පුර පසළොස්වක පොහෝ දින බිහි විය. සංඝරත්නය බිහි වූ පුන් පොහෝ දිනය වන්නේ,

i. පොසොන් පුර පොහෝ දිනයි.　　ii. ඇසළ පුර පොහෝ දිනයි.

iii. බිනර පුර පොහෝ දිනයි.　　iv. උඳුවප් පුර පොහෝ දිනයි.

13. බුදු දහමේ ශ්‍රද්ධාව බීජයක් ලෙස හඳුන්වන අතර, එම ශ්‍රද්ධාව නිර්වචනය කොට ඇත්තේ,

i. තෙරුවන් ගුණ දැන ඇති කරගන්නා පැහැදීම ශ්‍රද්ධාව යි.

ii. කුසල් දහම් වඩන මානසික අභ්‍යාසය ශ්‍රද්ධාව යි.

iii. නීවරණ ධර්ම යටපත් කරනුයේ ශ්‍රද්ධාව යි.

iv. ප්‍රඥාවෙන් කටයුතු කරනුයේ ශ්‍රද්ධාව යි.

14. ලෝකය හා ජීවිතය පිළිබඳව අපට ඇති කරගත හැකි අවබෝධය හඳුන්වන්නේ,

i. රූපාවචර,අරූපාවචර යනුවෙනි.　　ii. චිත්ත හා චෛතසික යනුවෙනි.

iii. කුසල හා ධ්‍යාන යනුවෙනි.　　iv. සම්මුති හා පරමාර්ථ යනුවෙනි.

15. 'කුමාරි' ආරම්භයේදී දක්ෂ සිසුවියක වූවා ය. එහෙත් මෑත කාලීනව ඇය තම පාඩම් කටයුතු මෙන්ම නිවසේ දෛනික කටයුතු ද පසුවට කල් දමන බව නිරීක්ෂණය විය. පංච නීවරණ අනුව ඇයට බලපා ඇත්තේ,

i. කාමච්ඡන්ද නීවරණය යි. ii. ථීනමිද්ධ නීවරණය යි.

iii. විචිකිච්ඡා නීවරණය යි. iv. ව්‍යාපාද නීවරණය යි.

16. කටු සටහනකින් තොරව එක්වරම පොත් ලිවීමට තරම් විශේෂ දක්ෂතාවයක් පැවතියේ,

i. වීදාගම මෛත්‍රී හිමියන්ට ය. ii. රේරුකානේ චන්දවිමල හිමියන්ට ය.

iii. හික්කඩුවේ සුමංගල හිමියන්ට ය. iv. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ට ය.

17. මිරිස් ව්‍යංජනයක් සඟරුවනට පූජා නොකොට ආහාරයට ගැනීම නිසා, තමාටම දඬුවම් පිණිස දුටුගැමුණු රජතුමා විසින් ඉදිකළ චෛත්‍යය වන්නේ,

i. ස්වර්ණමාලි මහා සෑය යි. ii. ලෝවාමහා ප්‍රාසාදය යි.

iii. කතරගම කිරි වෙහෙර යි. iv. මිරිසවැටිය යි.

18. සතර පෙර නිමිති තුළින් **අර්ථවත්** වන්නේ,

i. මහල්ලෙක්, ලෙඩෙක්, මළමිනියක්, පැවිදි රුවක්.

ii. ලෙඩෙක්, මහල්ලෙක්, මළමිනියක්, පැවිදි රුවක්.

iii. ජරා, ව්‍යාධි, මරණ, නිකෙලෙස්.

iv. ජාති, ජරා, ව්‍යාධි, මරණ .

19. ධම්මපදයේ අටුවා ග්‍රන්ථය ලෙස සම්භාවනාවට ලක් වන්නේ,

i. සද්ධර්මරත්නාවලිය යි. ii. රසවාහිනිය යි.

iii. ධම්මපදට්ඨ කථාව යි. iv. දහම් ගැට මාලාව යි.

20. **'අචරිත්වා බ්‍රහ්මචරියං'** යන ගාථා ධර්මයේ ඇති සමස්ත අර්ථයට වඩාත් උචිත ප්‍රකාශය වන්නේ,

i. සුදුසු කලට සුදුසු දේ කළ යුතු බවයි.

ii. තරුණ කාලයේ කාලයේදී ධනය රැස්කර ගත යුතු බවයි.

iii. වයසට නොගොස් සිල් ආරක්ෂා කළ යුතු බවයි.

iv. කෙළිදෙලෙන් කාලය ගත නොකළ යුතු බවයි.

21. නිතර නිදන සුළු බව, වැඩිපුර කතා කිරීම, අලසකම, අසත්පුරුෂයන් ඇසුරු කිරීම ආදී සමාජ අනර්ථයන් ගෙන දෙන කරුණු ඇතුළත් සූත්‍ර දේශනාව,

i. වසල සූත්‍රය යි. ii. පරාභව සූත්‍රය යි.

iii. මංගල සූත්‍රය යි. iv. අණන සූත්‍රය යි.

22. වාසෙට්ඨ සූත්‍රයට අනුව නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

i. සතුන් අතර ජීව විද්‍යාත්මක වෙනස්කම් පැවැතියත් මිනිසා තුළ එවැන්නක් නැත.

ii. වෘක්ෂලතා අතර වෙනස්කම් පැවතියත් මිනිසා තුළ එවැන්නක් නැත.

iii. සමාජ සම්බන්ධතා ගොඩනැගීමට සදිසා මහෝපකාරී වේ.

iv. දෙලොව යහපත සලසන කරුණු තිස් අටක් ඇතුළත්ය.

PAST PAPERS WIKI

23. හැඩරුවින් හා ගතිගුණවලින් කෙනෙකු තවත් කෙනෙකුට සමාන නොවේ. බුදු දහමට අනුව මෙයට හේතුව විය හැක්කේ,

i. ලොව මැවූ දෙවියන්ගේ කැමැත්තයි. ii. පෙර භවයන්හි කරන ලද කර්මයන්හි බලපෑමකි.

iii. එය ඉබේ සිදුවන්නකි. iv. අදෘශ්‍යමාන හස්තයක බලපෑමකි.

24. ජලය රත් වී උතුරනවිට බුබුළු නැගෙන ජලයෙහි යමක් දැකිය නොහැකිය. මෙම උදාහරණයෙන් පෙන්වා දෙන නීවරණය වන්නේ,

i. කාමච්ඡන්දය යි. ii. ව්‍යාපාදය යි.

iii. ථීනමිද්ධය යි. iv. විචිකිච්ඡාව යි.

25. තමාගේ අභිමතය පරිදි සාර මසක් මුළුල්ලෙහි භාවනා කොට ප්‍රතිඵලයක් **නොලැබූ** භික්ෂුව වන්නේ,

i. පුණ්ණ හිමියන් ය. ii. ස්වර්ණකාර හිමියන් ය.

iii. ලකුණ්ඨක භද්දිය හිමියන් ය. iv. චුල්ලපන්තක හිමියන් ය.

26. සිතීමේ හා විමසීමේ නිදහස පූර්ණ වශයෙන් තහවුරු කොට ඇති බුදු දහම, ඒ පිළිබඳව පරීක්ෂා කළ යුතු ආරංචි මාත්‍රය, පරම්පරාව, කටකතා ආදී කරුණු දහයක් ඇතුළත් වන්නේ,

i. වීමංසක සූත්‍රයේ ය. ii. අරිය පර්යේෂණ සූත්‍රයේ ය.

iii. කාලාම සූත්‍රයේ ය. iv. මහා පරිනිබ්බාන සූත්‍රයේ ය.

27. බුදු දහමේ පෙන්වා දෙන ආකාරයට පවතින සියලු දේ (සංස්කාර ධර්ම),

i. ස්ව කැමැත්ත මත සිදුවේ. ii. පූර්ව කර්මය අනුව සිදුවේ.

iii. හේතුඵල සම්බන්ධය මත සිදුවේ. iv. අහේතුකව සිදුවේ.

28. සිත කිළිටි කරන, කුසල් සිත් වලට බාධා කරන සිතුවිලි කුමන නමකින් හැඳින්වේ ද?

i. අකුසල චේතනා නමිනි. ii. නීවරණ ධර්ම නමිනි.

iii. පාපී කෙලෙස් නමිනි. iv. මෝහ චේතනා නමිනි.

29. සිදුහත් බෝසතාණෝ "**කිං කුසල ගවේසී**"ව සිටි කාලයේදී හමු වූ ආළාරකාලාම හා උද්දකරාමපුත්ත යන තවුසන් දෙදෙනා පිළිවෙළින් ලැබූ අධිගමයන් වන්නේ,

i. සප්ත සමාපත්ති හා අෂ්ට සමාපත්තයයි. ii. අෂ්ට සමාපත්ති හා පංච අභිඥාව යි.

iii. පංච අභිඥා හා සප්ත සමාපත්තය යි. iv. අෂ්ඨ සමාපත්ති හා චතුර්ථ ධ්‍යානය යි.

30. මිනිසාට තම ජීවිතයේ සෙවන, ආහාර, ගෘහභාණ්ඩ, ඖෂධ, පිරිසිදු වාතය ආදී බොහෝ දේ දෙන වෘක්ෂලතා විනාශ කිරීමෙන් **සිදුනොවන** පාරිසරික බලපෑම කුමක්ද?

i. ලැව් ගිනි ඇති වේ. ii. පාංශු ඛාදනය වේ.

iii. ජල උල්පත් සිඳී යයි. iv. නාය යාම සිදුවේ.

31. බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන මිගදායේ දී පස්වග භික්ෂූන් අමතා සිදුකළ ප්‍රථම ධර්ම දේශනාව වන්නේ,

i. චුල්ලහත්ථි පදෝපම සූත්‍රය යි. ii. දම්සක් පැවතුම් සූත්‍රය යි.

iii. අනත්ත ලක්ඛණ සූත්‍රය යි. iv. මහා මංගල සූත්‍රය යි.

32. ධර්ම විවරණවල දක්නට ලැබෙන ආකාරයට සසර දුක ත්‍රිවිධාකාර වේ. එකී තුන් ආකාරයට අදාළ නොවන වරණය වන්නේ,

i. දුක්ඛ දුක්ඛ ii. මරණම්පි දුක්ඛ

iii. විපරිණාම දුක්ඛ iv. සංඛාර දුක්ඛ

33. බුදුරජාණන් වහන්සේ වෛද්‍යවරයෙකු බව පෙළ දහමේ සඳහන් වේ. **'සත්හට වන බව දුකට වෙදාණන්'** යන කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

i. බුදුගුණ අලංකාරය යි. ii. සුභාෂිතය යි.

iii. ගුත්තිල කාව්‍යය යි. iv. ලෝවැඩ සඟරාව යි.

34. පමණ දැන ආහාර ගැනීමෙහි ප්‍රතිඵල ලෙස රෝගාබාධ අඩුවීම, නිදුක් බව, සැහැල්ලු බව, කාය බලය හා සුවපහසුව යන කරුණු පෙන්වා දී ඇත්තේ,

i. භද්දාලි සූත්‍රයේ ය. ii. අණන සූත්‍රයේ ය.

iii. පංච ඉට්ඨධම්ම සූත්‍රයේ ය. iv. ආහාර සූත්‍රයේ ය.

35. ආහාර අනුභව කළ යුත්තේ කුසට ඔරොත්තු දෙන තරමටය. පමණ දැන ආහාර ගන්නා ලෙස බුදුරදුන් වදාළේ,

i. කොසොල් රජුට ය. ii. බිම්බිසාර රජුට ය.

iii. අජාසත් රජුට ය. iv. සුද්ධෝදන රජුට ය.

36. සාසන සුරක්ෂිතතාව තහවුරු කරනු පිණිස වර්ග කරන ලද ධර්මය, මුඛ පරම්පරාගතව පවත්වා ගැනීමට භාණක පරම්පරාවන්ට පවරන ලදී. ඒ අනුව ඛුද්දක නිකාය පවරන ලද්දේ,

i. ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවට ය.

ii. සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පරම්පරාවට ය.

iii. මහා කාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පරම්පරාවට ය.

iv. සියලු භික්ෂූන් වහන්සේලාට ය.

37. ආරම්භයේදී බුද්ධකාය නිර්මාණය කරන්නට පසුබට වූ කලාකරුවා ඒ වෙනුවට විවිධ සංකේත මගින් බුදුරුව නිරූපණය කර ඇත. එසේ **යොදා නොගත්** සංකේතය නම් කරන්න.

i. බෝධිය. ii. ස්ථූපය.

iii. විජිනිපත. iv. සිරිපතුල.

38. විහාර මන්දිරයක දොරටු අලංකාර කරන **පඩිපෙළ දෙපස පිහිටි** අර්ධ කවාකාර ගල් පුවරුව ............ නමින් හැඳින්වේ.

i. සඳකඩ පහණ ii. වාහල්කඩ

iii. මුරගල iv. පියගැට පෙළ

39. මහනුවර යුගයේ විහාර චිත්‍ර කලාවෙහි දක්නට **නොලැබෙන** ලක්ෂණය සහිත පිළිතුර තෝරන්න.

i. රේඛා කර්මය හා වර්ණ පූරණය.

ii. මිනිස්, සත්ව හා වෘක්ෂ රූප ස්වාභාවිකය.

iii. පිරිමි හා ගැහැණු රූප චිත්තාකර්ෂණීය නොවේ.

iv. පර්යාවලෝකය නැත.

40. සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, බුද්ධත්ත්වය, බුද්ධ පරිනිර්වානය ආදී සිදුවීම් අතරින් සම්බුද්ධ පරිනිර්වානය සිදු වූයේ,

i. ලුම්බිණි සල් උයනේ ය. ii. ගයාවේ ඇසතු බෝරුක මුලදී ය.

iii. බරණැස ඉසිපතනයේ මිගදායේ ය. iv. කුසිනාරා නුවර උපවත්තන සල් උයනේ ය.

ii පත්‍රය

1.

i. සච්චක, බක, බ්‍රහ්ම ආදීන් දමනය කිරීමෙන් ප්‍රකටවන බුදුගුණය ලියා දක්වන්න.

ii. **'අත්ථී සුඛ'** යන්නෙහි අර්ථය සැකෙවින් දක්වන්න.

iii. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස දෙකක් නම් කරන්න.

iv. **සීල පාරමිතාවට** හා **නෙක්ඛම්ම පාරමිතාවට** අදාළ ජාතක කතා දෙක ලියා දක්වන්න.

v. **'උපාදාන පච්චයා භවෝ'** පාඨයෙහි අදහස ලියන්න.

vi. අරහං බුදු ගුණය පාදක කොටගෙන ලියන ලද කෘතිය හා එහි කතුවරයා නම් කරන්න.

vii. අණන සූත්‍රය අනුව පුද්ගලයෙකුට මෙලොවදී ලැබිය හැකි සැප හතරක් පෙන්වා දී ඇත. ඉන් දෙකක් නම් කරන්න.

viii. කර්මය බෙදන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

ix. ශ්‍රී ලාංකේය විහාර චිත්‍ර, මූර්ති ආදී කලා ශිල්ප වලින් සාධනය වන අරමුණු දෙකක් ලියන්න.

x. දසරාජ ධර්ම අතර දැක්වෙන **දානය** හා **පරිත්‍යාගය** අතර වෙනස සංක්ෂිප්තව පැහැදිලි කරන්න.

2.

i. සිදුහත් කුමරු අභියෝග ජයගත් අවස්ථා දෙකක් නම් කරන්න.

ii. ඉන් එක් අවස්ථාවක් කෙටියෙන් පහදන්න.

iii. බුද්ධකාරක ධර්ම තුළින් ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

3.

i. **'නතං කම්මං කතං සාධු...'** යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවේ අර්ථය ලියා දක්වන්න.

iii. පුද්ගල විසමතා කෙරෙහි කර්මය බලපාන ආකාරය පෙන්වා දෙන්න.

4.

i. දෙවන ධර්ම සංගායනාවට තුඩු දුන් හේතු දෙකක් ලියා දක්වන්න.

ii. එම සංගායනාව පැවැත් වූ ස්ථානය, මූලිකත්වය ගත් රහතන් වහන්සේ හා අනුග්‍රහය දැක් වූ රජතුමා පිළිවෙළින් නම් කරන්න.

iii. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ශාසනයේ චිර පැවැත්ම කෙරෙහි බලපෑ ආකාරය විමසන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

5.

i. හේතුඵල දහමේ සඳහන් ද්වාදස අංගයන්ගෙන් දෙකක් ලියන්න.

ii. පටිච්චසමුප්පාද කෙටි සූත්‍රය දක්වා එහි අර්ථය පැහැදිලි කරන්න.

iii. පටිච්චසමුප්පාද න්‍යාය තුළින් ගැටලු නිරාකරණය කරගන්නා ආකාරය උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

6.

i. පමණ දැන ආහාර ගැනීමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල දෙකක් නම් කරන්න.

ii. **'ජිගච්ඡා පරමා රෝගා'** යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. ආහාර පාලනය තුළින් කායික නීරෝගී බව උදාකර ගත හැකි ආකාරය උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. කල්‍යාණ මිත්තතා

ii. බෝධිසරය

iii. ථීනමිද්ධ නීවරණය

iv. රේරුකානේ චන්දවිමල නාහිමිපාණන් වහන්සේ

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

අ.පො.ස සාමාන්‍ය පෙළ පෙරහුරු ආදර්ශ ප්‍රශ්න පත්‍රය 2 සඳහා පිළිතුරු පත්‍රය - 2026

11 - S බුද්ධ ධර්මය 1- 11

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 01 | 03 | 11 | 02 | 21 | 02 | 31 | 02 |
| 02 | 01 | 12 | 02 | 22 | 02 | 32 | 02 |
| 03 | 01 | 13 | 01 | 23 | 02 | 33 | 04 |
| 04 | 01 | 14 | 04 | 24 | 02 | 34 | 01 |
| 05 | 01 | 15 | 02 | 25 | 02 | 35 | 01 |
| 06 | 03 | 16 | 02 | 26 | 03 | 36 | 04 |
| 07 | 01 | 17 | 04 | 27 | 03 | 37 | 03 |
| 08 | 02 | 18 | 03 | 28 | 02 | 38 | 03 |
| 09 | 03 | 19 | 03 | 29 | 01 | 39 | 02 |
| 10 | 04 | 20 | 01 | 30 | 01 | 40 | 04 |

I. පුරිස දම්මසාරථී බුදු ගුණය

II. උත්සාහයෙන් හා දැතේ මහන්සියෙන් දහඩිය වගුරවමින් ධාර්මික ව උපයාගත් ධනයක් තමන්ට ඇතැයි සිතා යමෙක් සතුටු වෙයි ද, එය අත්ථි සුඛය යි.

III. 1. මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම.
2. කීර්තිය පැතිරීම.
3. ඕනෑම පිරිසක් මැදට නිර්භය ව එළඹීමට හැකි වීම.
4. සිහි මුලා නොවී කලුරිය කිරීම.
5. මරණින් පසු සුගතියෙහි උපත ලැබීම.

IV. සීල පාරමිතාව - සීල විමංස ජාතකය
නෙක්ඛම්ම පාරමිතාව - මඛාදේව ජාතකය

V. සිතින් දැඩිව අල්ලා ගැනීම නිසා නැවත නැවත භවයට එකතු වේ.

VI. පූජාවලිය/මයුරපාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමියන්

VII. අත්ථි සුඛය, භෝග සුඛය, අනණ සුඛය, අනවජ්ජ සුඛය

VIII. කුසල කර්ම හා අකුසල කර්ම

IX. 01. බෞද්ධ සාරධර්ම ජනතාව අතරට රැගෙන යන ප්‍රබල මාධ්‍යක් වීම.
02. පොදු ජන මනසට ධාර්මික සුවයක් ලබා දීම.
03. හෙළ සංස්කෘතියේ ප්‍රෞඪත්වය ලොවට හෙළි කිරීම.
04. දිගු ඉතිහාසයකට උරුමකම් කියන ජාතියක් ලෙසට ලාංකිකයන් පත් වීම.
05. දෙස් විදෙස් සංචාරක ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට හේතු වීම.

PAST PAPERS WIKI

Past Papers Wiki

X. **දානය**

රටවැසියාගේ ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා අවශ්‍ය ප්‍රාග් ධනය ලබා දීම අර්ථවත් කෙරේ. කෘෂිකර්මාන්තය, වෙළඳාම, සත්ව පාලනය ආදී කිසියම් ජීවන වෘත්තියක් ආරම්භ කොට ක්‍රියාත්මක කරගෙන යාමට අවශ්‍ය පහසුකම් පාලකයා විසින් ලබා දිය යුතු ය. ඒ තුළින් රටත් සමාජයත් ස්වංපෝෂිත තත්වයට පත්කළ හැකි ය.එම සුභ සාධන සේවා දානයට අයත් වේ.

**පරිත්‍යාගය**

පාලකයා රටවැසියාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය, සුවපහසුව යනාදිය කැප කළ යුතු ය. එම කැප කිරීම පරිත්‍යාගය ලෙස අර්ථවත් කෙරේ.

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය 2

## බුද්ධ ධර්මය ii කොටස සඳහා පිළිතුරු (2 - 7)

2. i

1. ශිල්ප දක්වා ශාක්‍ය වංශිකයන්ගේ සැකය දුරු කිරීම .
2. සතර පෙර නිමිති දැකීමෙන් පසු ගිහිගෙය අතහැර අභිනිෂ්ක්‍රමණය කිරීම.
3. පස්වග තවුසන් හැරගිය පසු තනිවම වීර්ය වැඩීම.
4. සිදුහත් කුමරු අධික ලෙස සැප සම්පත් විඳින බැවින් සටන් ශිල්ප නොදන්නා බවට ශාක්‍ය වංශික ඥාතීන් අතර සැකයක් මතුවීම.

2.. ii

- දෙවියන්ගේ ආරාධනය පිළිගැනීමට පෙර **පංච මහා විලෝකනය** මගින් නිසි පසුබිම විමසා බැලීම, වැදගත් තීරණ ගැනීමේදී සිතා විමසා බැලිය යුතු බවට ශිෂ්‍ය අපට මහඟු පූර්වාදර්ශයකි.
- කුමාරයෙකුට අවශ්‍ය නීති ශාස්ත්‍රය, දුනු ශිල්පය, අශ්වයන් හා ඇතුන් හැසිරවීම වැනි සියලු ශිල්ප ශාස්ත්‍ර **සර්ව මිත්‍ර** නම් ගුරුවරයාගෙන් ඉතා කෙටි කලකින් ඉගෙන ගැනීමට උන්වහන්සේ සමත් වූහ.
- කුඩා කල සිටම උන්වහන්සේ තුළ පැවති **කීකරුකම, කාරුණික බව, මෙත් සිතිවිලි සහ නිර්භීතකම** වැනි ගුණාංග ශිෂ්‍ය ජීවිතයකට ආදර්ශවත් වේ.
- සොළොස් හැවිරිදි වියේදී තමා සතු ශිල්පීය දක්ෂතා ඥාතීන් ඉදිරියේ විදහා දක්වමින් ඔවුන් තුළ වූ සැකය දුරු කිරීම බෝසතුන් ලැබූ තවත් එක් අභියෝගාත්මක ජයග්‍රහණයකි.
- කුල කුමරියන් රාශියක් අතුරින් තමන්ට සුදුසු කුල කුමරියක සොයා ගැනීමද මහත් අභියෝගයකි. එය ජයගනිමින් භද්දකච්චානා (යසෝදරා) කුමරිය තෝරාගත්තේය.
- සුද්ධෝදන රජතුමා විසින් ලබා දුන් **රම්‍ය, සුරම්‍ය, සුභ** යන මාලිගා ඇතුළු අධික සැප සම්පත්වල නොඇලී ජීවිතයේ යථාර්ථය සෙවීමට උත්සාහ කිරීම උන්වහන්සේගේ සුවිශේෂී ලක්ෂණයකි.
- සතර පෙරනිමිති (මහල්ලෙක්, ලෙඩෙක්, මළකඳක් සහ පැවිදි රුවක්) දැකීමෙන් ජීවිතයේ ජරා, ව්‍යාධි, මරණ යන දුක් වේදනා තේරුම් ගෙන ඒවායින් මිදීමට මාර්ගයක් සෙවිය යුතු බව උන්වහන්සේ වටහා ගත්හ.
- රාහුල කුමරුගේ උපත නිසා ඇති වූ ජීවිත බන්ධනය (රාහුලයෙක් උපන්නා. බැම්මක් ඇතිවුනා) පවා පසෙකලා, සකල සත්ත්වයා සසර දුකින් මුදවා ගැනීම සඳහා උන්වහන්සේ මහාභිනිෂ්ක්‍රමණය කළහ.
- දුෂ්කර ක්‍රියාව ඇතුළු විවිධ අභියෝග ඉවසීම, කැපවීම සහ අධිෂ්ඨානය පෙරදැරිව ජයගෙන උන්වහන්සේ ලොව්තුරා බුදු බව ලබා ගත්හ.

2. iii

- **දානය** - තමා සතු පොත්පත්, සටහන් සහ දැනුම අනෙක් සහෝදර ශිෂ්‍යයන් සමඟ බෙදාහදා ගනිමින් සාමූහිකව අධ්‍යාපනය ලැබීම.
- **සීලය** - පාසල් නීතිරීති සහ පංති කාමරයේ විනය රැකීම, ගුරු-දෙගුරුන්ට ගෞරව කිරීම සහ යහපත් චරිතයක් ගොඩනගා ගැනීම.
- **නෙක්කම්ම** - අධ්‍යාපනයට බාධා වන අනවශ්‍ය විනෝදාංශ, ජංගම දුරකථන/සමාජ මාධ්‍ය භාවිතය සහ කාලය නාස්ති වන ක්‍රියාකාරකම්වලින් බැහැර වීම.
- **පඤ්ඤා** - නුවණින් සිතා බලා යහපත හා අයහපත හඳුනා ගැනීම, ක්‍රමවත් ලෙස පාඩම් වැඩ සැලසුම් කිරීම සහ නිරවුල්ව කරුණු තේරුම් ගැනීම.

PAST PAPERS WIKI

- **වීර්යය** - අලසකමින් තොරව දිනපතා පාඩම් වැඩ කිරීම, පැවරුම් නිසි වේලාවට අවසන් කිරීම සහ විභාග අභියෝග හමුවේ නොසැලී උත්සාහ කිරීම.
- **ඛන්ති** - අධ්‍යාපන කටයුතුවලදී මුහුණ දීමට සිදුවන දුෂ්කරතා, වෙහෙස මහන්සිය සහ බාධා ඉවසීමෙන් දරා ගැනීම.
- **සච්ච** - ගුරුවරුන්ට සහ දෙමාපියන්ට සත්‍යවාදී වීම, කොපි කිරීම වැනි අසත්‍ය ක්‍රියාවලින් බැහැරව අවංකව අධ්‍යාපනය ලැබීම.
- **අධිට්ඨාන** - "මම මෙම විභාගයෙන් ඉහළම ප්‍රතිඵල ලබා ගනිමි" යි පැහැදිලි ඉලක්කයක් තබාගෙන එය ඉටු කරගැනීමට දැඩි අදිටනින් කටයුතු කිරීම.
- **මෙත්තා** - පන්තියේ සියලුම සහෝදර ශිෂ්‍යයන් කෙරෙහි මෛත්‍රියෙන් හා සහයෝගයෙන් කටයුතු කිරීම.
- **උපෙක්ඛා** - ජය-පරාජය, ප්‍රශංසා-චෝදනා හමුවේ කම්පා නොවී මධ්‍යස්ථව අධ්‍යාපනික ඉලක්ක වෙත ගමන් කිරීම.

3. i

න තං කම්මං කතං සාධු - යං කත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛො රොදං - විපාකං පටිසේවති

3. ii

යම් කර්මයක විපාක කඳුළු පිරුණු මුහුණින් යුතුව හඬා වැලපෙමින් විඳීමට සිදු වේ නම්, එවැනි අකුසල කර්ම නොකිරීම සුදුසු ය. (කිරීමෙන් වැළකිය යුතුය).

3. iii

චූල්ලකම්මවිභංග සූත්‍රයට අනුව මිනිසුන් අතර දක්නට ලැබෙන විවිධ උසස්-පහත්, යහපත්-අයහපත් පුද්ගල විෂමතාවලට ප්‍රධාන වශයෙන්ම බලපාන්නේ තමන් විසින් කරනු ලබන කුසල සහ අකුසල කර්මයන්ය.

- සතුන් මැරීම සහ හිංසා කිරීම - අල්පායුෂ්ක වීම.
- සතුන් නොමැරීම සහ මෛත්‍රී කිරීම - දීර්ඝායුෂ්ක වීම.
- අන් අයට හිංසා පීඩා කිරීම - ආබාධිත වීම.
- අන් අයට අනුකම්පා කිරීම - අල්පාබාධිත වීම.
- නිතර කෝප වීම සහ වෛර කිරීම - දුර්වර්ණ වීම.
- මෛත්‍රී සහගත වීම, කෝප නොවීම - සුන්දර/ප්‍රසාදජනක රූප ලැබීම.
- අන් අය කෙරෙහි ඊර්ෂ්‍යා කිරීම - (පිරිස් සපත්තිය) අලපේශාක්‍ය වීම.
- ඊර්ෂ්‍යා නොකිරීම, අන් අයගේ දියුණුවට සතුටු වීම - මහේශාක්‍ය වීම.
- දන් නොදීම, තද මසුරුකම - අල්පභෝගී වීම.
- දන් දීම, ත්‍යාගශීලී වීම - මහාභෝගී වීම.
- උඩඟු වීම, ගරු කළ යුත්තන්ට ගරු නොකිරීම - නීච කුලවල ඉපදීම.
- යටහත් පහත් වීම, වැඩිහිටියන්ට ගරු කිරීම - උසස් කුලවල ඉපදීම.
- උගතුන්ගෙන්, නුවණැත්තන්ගෙන් ශ්‍රමය/දැනුම නොවිමසීම, අලසකම - දුෂ්ප්‍රාඥ වීම.
- හොඳ-නරක, කුසල්-අකුසල් පිළිබඳ අසා දැනගැනීමට උත්සාහ කිරීම - මහාප්‍රාඥ වීම.

4. i

1. වජ්ජිපුත්තක භික්ෂූන් විසින් විනය විරෝධී කරුණු දහයක් (දස වස්තුව) කැප යැයි දක්වමින් සමාජගත කිරීම.
2. ශාසනික පවිත්‍රත්වයට හා භික්ෂු විනයට හානි වන පරිදි ශික්ෂා පද ලිහිල් කිරීමට සූදානම් වීම.

4. ii

1. ස්ථානය - විශාලා මහනුවර වාලුකාරාමය
2. මූලිකත්වය ගත් රහතන් වහන්සේ - සබ්බකාමී රහතන් වහන්සේ (සභාපතිත්වය) සහ යස තෙරුන් වහන්සේ / රේවත රහතන් වහන්සේ
3. අනුග්‍රහය දැක්වූ රජතුමා - කාලාශෝක රජතුමා

4. iii

- දස වස්තුව අකැප, අවිනීත කරුණු ලෙස සම්මත කර ප්‍රතික්ෂේප කිරීමෙන් බුද්ධ ශාසනයේ විනය පවිත්‍රතාව ආරක්ෂා වීම.
- බුද්ධ මතය දැරූ පිරිස **ථේරවාදී** සහ වෙනස් මත දැරූ පිරිස **මහාසාංඝික** ලෙස ශාසනය තුළ ප්‍රථම වතාවට නිකාය භේදය ඇතිවීම.පසු කාලීනව නිකාය දහඅටක් (අටළොස් නිකාය) දක්වා වර්ධනය වීම.
- මාස 8 ක් පුරා ධර්මය හා විනය නැවත සංගායනා කර විධිමත් කිරීම නිසා අනාගත පරපුරට පිරිසිදු බුද්ධ ධර්මය පවත්වාගෙන යාමට පදනම වැටීම.

5. i

අවිජ්ජා (නොදැනුවත්කම)

තණ්හා (ඇලීම)

(සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, උපාදාන, භව, ජාති, ජරාමරණ)

5. ii

ඉමස්මිං සති ඉදං හොති - ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති

ඉමස්මිං අසති ඉදං න හොති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති

**මෙය ඇති කල්හි මෙය වෙයි - මෙය ඉපදීමෙන් මෙය උපදී. (හේතු ඇති විට ඵල හටගනී)**

**මෙය නැති කල්හි මෙය නොවේ - මෙය නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වෙයි. (හේතු නැති වූ විට ඵල නැති වී යයි)**

5. iii

- සියලුම භෞතික හා මානසික සිදුවීම් අහඹු ලෙස සිදු නොවී, හේතු-ඵල සම්බන්ධතාවය මත පමණක් සිදුවන බව බුදුදහම අවධාරණය කරයි.
- පටිච්චසමුප්පාද න්‍යාය යොදාගනිමින් ප්‍රශ්නයක මුල (හේතුව) සොයාගෙන එය නැති කිරීමෙන් ගැටලුව සම්පූර්ණයෙන්ම විසඳාගත හැක.
- විභාගයෙන් අසමත් වීම හෝ අඩු ලකුණු ලැබීම. - විභාගයට නිසි ලෙස සූදානම් නොවීම, වේලාව කළමනාකරණය නොකිරීම, පාඩම් වැඩ මඟහැරීම.
- හොඳින් පාඩම් කිරීම, කාලසටහනකට වැඩ කිරීම) මගින් ඊළඟ වතාවේදී විශිෂ්ට සාමාර්ථයක් ලැබීම

6. i

නිරෝගී බව,

එදිනෙදා වැඩකටයුතු පහසුවෙන් වීම.

6. ii

Past Papers Wiki

- කුස ගින්න හෙවත් සාගින්න තරම් තවත් බලවත් රෝගයක් නොමැත යන්න මෙහි අදහසයි.
- අනෙකුත් රෝග සඳහා ඖෂධ ලබා දී සම්පූර්ණයෙන්ම සුවපත් කළ හැකි වුවද, සාගින්න නම් රෝගයට දිනපතාම ආහාර නමැති ඖෂධය ලබා දිය යුතුය.
- කුසගින්න ඇතිවිට කිසිවක් නිවැරදිව කළ නොහැකිය.
- දින කීපයක් නොලැබීමෙන් ශරීරය දුර්වල වී ක්ලාන්තය ඇතිවේ.
- මරණය පවා සිදුවේ.
- එබැවින් බුදුරජාණන් වහන්සේ සාගින්න සියලු රෝග අතුරින් බලවත්ම රෝගය ලෙස පෙන්වා දී ඇත.

6. iii

- ආහාර පාලනය (මත්තඤ්ඤුතා) යනු සිරුරට අවශ්‍ය නිසි ප්‍රමාණය හඳුනාගෙන ආහාර ගැනීමයි. එමගින් කායික නිරෝගීබව උදා කරගත හැකිය.
- පමණ ඉක්මවා ආහාර ගැනීම නිසා ඇතිවන අපහසුව, අජීර්ණය, නිදිමත සහ අලසකම නැති වී සිරුර ප්‍රබෝධමත් වේ.
- නිසි ආහාර පාලනයක් පැවැත්වීමෙන් වර්තමානයේ බහුලව පවතින දියවැඩියාව, අධික රුධිර පීඩනය, හෘදයාබාධ සහ තරබාරුකම වැනි බෝ නොවන රෝගවලින් වැළකී සිටිය හැක.
- අධික ලෙස ආහාර ගැනීම නිසා දැඩි කායික පීඩාවට පත් කොසොල් රජතුමාට, බුදුරජාණන් වහන්සේ පමණ දැන ආහාර ගැනීමේ අගය පෙන්වා දුන් සේක. රජතුමා එම උපදෙස පිළිපැද ආහාර පාලනය කිරීමෙන් ස්ථූලතාවය අඩු කරගෙන කායික නිරෝගීබව සහ සැහැල්ලුව උදා කරගත්තේය.

7. කෙටි සටහන්

1. කල්‍යාණ මිත්තතා

- යහපත්, පින්වත්, සත්පුරුෂ මිතුරන් යන අදහස යි.
- කල්‍යාණ මිත්‍රයා ශ්‍රද්ධාව, සීලය, ත්‍යාගය සහ ප්‍රඥාව යන ගුණාංගවලින් යුක්ත වෙයි.
- කල්‍යාණ මිත්‍රයා තම මිතුරා පාපයෙන් වළක්වා යහපතෙහි යොදවයි.
- මෙලොව හා පරලොව දියුණුව සලසා ගැනීමට මග පෙන්වයි.
- නිවන් මග (ආර්ය අෂ්ටාංගික මාර්ගය) පූර්ණය කර ගැනීමට උපකාර කරයි.

2. බෝධිඝරය

- ශ්‍රී මහා බෝධීන් වහන්සේ ආරක්ෂා කිරීම සඳහා සහ වන්දනාමාන කිරීමේ පහසුව උදෙසා බෝධිය වටා ඉදිකළ ගෘහය යි.
- බෝධීන් වහන්සේට වැඩෙන්නට අවකාශ තබා බෝධිය වටා පියස්සක් යෙදීමෙන් මෙය ඉදි වේ.
- බෝධීන් වහන්සේට අව් වැසි සුළඟ ආදියෙන් වන හානි අවම වේ.
- වන්දනා කරන්නන්ට පහසුව සැලසේ.
- අලංකාරයක් ගෙන දේ.
- ලංකාවේ ඉතිරිව ඇති නටබුන් අතර කුරුණෑගල නිල්ලක්ගම බෝධිඝරය සුවිශේෂ වේ.
- අනුරපුර ජේතවන පුදබිමේ සාංචි ගරාදි වැටට සමාන වැටක් යෙදූ බෝධිඝරයක නටබුන් දක්නට ලැබේ.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

3. ථීනමිද්ධ නීවරණය

- සිතේ ඇතිවන මන්දගාමී බව, අලසකම සහ නිදිමත ස්වභාවය යි
- ථීන = සිතේ ගිලන් බව, මිද්ධ = කයේ ගිලන් බව.
- සිතේ ඒකාග්‍රතාවය හා ප්‍රඥාව නැති කර, කුසල් දහම්හි යෙදීමට ඇති උනන්දුව අඩපණ කරයි.
- දියුණුව අඩාල වේ.
- නිවණ දුරස් වේ.

✓ ඉරියව් වෙනස් කිරීම
✓ මුහුණ සේදීම
✓ ස්නානය
✓ වෙනත් කාර්යයක යෙදීම
✓ චිත්ත ශක්තිය මගින් ථීනමිද්ධ දුරුකළ හැකිය.

4. රේරුකානේ චන්දවිමල නාහිමිපාණන් වහන්සේ

- ශ්‍රී ලංකාවේ සම්බුද්ධ ශාසනයට සහ ධර්ම ශාස්ත්‍රයට අසහාය සේවයක් කළ අතිපූජ්‍ය අමරපුර මහා නිකායේ මහානායක හිමිනමකි.
- 1897 ජූලි මස 19 වන දින රේරුකාන ගමෙහි උපත ලැබීය. ගිහි නම රුබෙල් ගුණවර්ධන වූ අතර පවුලේ වැඩිමලා විය.
- 1906 ජනවාරි 08 වන දින බුරුම ජාතික යූ. විනයාලංකාර හිමියන් යටතේ රේරුකානේ චන්දවිමල නමින් පැවිදි විය.
- 1908 දී බුරුමයට (මියන්මාරයට) වැඩම කර බුරුම භාෂාව, සූත්‍ර, විනය සහ අභිධර්මය ඉතා මැනවින් ප්‍රගුණ කළහ. 1917 ඔක්තෝබර් 26 වන දින බුරුමයේදී උපසම්පදාව ලැබූහ.
- සාමාන්‍ය ජනයාට පවා සරලව තේරුම් ගත හැකි පරිදි බෞද්ධයාගේ අත්පොත, අභිධර්මයේ මූලික කරුණු, පුණ්‍යෝපදේශය, සූවිසි මහ ගුණය, චතුරාර්ය සත්‍යය වැනි පොත්පත් රාශියක් රචනා කළහ.
- පිරිසිදු ථේරවාදී ධර්ම කරුණු වෙනස් නොකොට, නිවැරදිව ජනතාව අතරට ගෙන යාමට කැපවීය.
- ඉතා සරල, අල්පේච්ඡ ජීවිතයක් ගත කළහ. තමා ලියූ ග්‍රන්ථවලින් මුදල් ඉපයීමට බලාපොරොත්තු නොවූ අතර ඒවා ධර්ම දානය පිණිසම කළහ.
- 'සාහිත්‍ය චක්‍රවර්ති', 'සම්මාන පණ්ඩිත' සහ 'ප්‍රවචන විශාරද' වැනි ගරු නාම රාශියකින් පිදුම් ලැබූහ.
- 1997 ජූලි 04 වන දින අපවත් වූහ.

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank